**1986 දෙසැම්බර් මස 4 වන දිනැති අංක 41/128 දරන මහා මණ්ඩල යෝජනාව මගින්**

**සම්මත කරගන්නා ලද**

**සංවර්ධනය සඳහා ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශනය**

මහා මණ්ඩලය විසින්,

ආර්ථික, සාමාජීය, සංස්කෘතික හෝ මානුෂවාදී ස්වභාවයකින් යුක්ත වූ අන්තර්ජාතික ගැටළු නිරාකරණය කර ගැනීමෙහි ලා සහ ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව හෝ ආගම පිළිබඳ කවර හෝ වෙනස්කමකින් තොරව සියලු දෙනාම සඳහා මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස කෙරෙහි ඇති ගරුත්වය වර්ධනය කිරීමෙහි ලා අන්තර්ජාතික සහයෝගීතාවය ගොඩ නගා ගැනීම සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ පරමාධ්‍යාශ හා ප්‍රතිපත්ති සිත් හි දරමින් ද,

සංවර්ධනය යනු සමස්ත ජනතාවගේ සහ සියලු තැනැත්තන්ගේ සංවර්ධනය කෙරෙහි වූ ක්‍රියාකාරී, නිදහස් සහ අර්ථාන්විත සහභාගීත්වය මත පදනම් වූ ද එතුළින් උද්ගත වන්නා වූ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යාම මත පදනම් වූ ද ජනතාවගේ සහ සියලු තැනැත්තන්ගේ සුභසාධනයේ නිරන්තර අභිවෘද්ධිය ඉලක්ක කර ගනුලැබුවා වූ ද පරිපූර්ණ ආර්ථික, සාමාජයීය, සංස්කෘතික හා දේශපාලන ක්‍රියාවලියක් වන බව හඳුනා ගනිමින් ද,

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ විධිවිධාන යටතේ දක්වා ඇති මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගත හැකි වන්නා වූ සාමාජයීය හා අන්තර්ජාතික ව්‍යුහයක් සඳහා සෑම දෙනාට ම හිමිකමක් ඇති බව සැලකිල්ලට ගනිමින් ද,

ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ සහ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ විධිවිධාන සිහිපත් කරමින් ද,

යටත්විජිතහරණය, වෙනස්කම්වලට බඳුන් කිරීම වැළැක්වීම, මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහසට ගරු කිරීම සහ ඒවා ආරක්ෂා කිරීම, අන්තර්ජාතික සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම හා එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව රාජ්‍යයන් අතර මිත්‍රශීලී සම්බන්ධතා සහ සහයෝගීතාව තවදුරටත් වර්ධනය කිරීම සම්බන්ධයෙන් වන ලේඛණ ඇතුළුව මනුෂ්‍ය වර්ගයාගේ සමස්ත සංවර්ධනය, සියලු ජාතීන්ගේ ආර්ථික හා සාමාජීය ප්‍රගමනය හා සංවර්ධනය සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ සහ එහි විශේෂ නියෝජිතායතනවල අදාළ ගිවිසුම්, ප්‍රඥප්ති, යෝජනා, නිර්දේශ සහ වෙනත් ලේඛණ තවදුරටත් සිහිපත් කරමින් ද,

ජාතීන් හට නිදහසේ තම දේශපාලන තත්ත්වය තීරණය කිරීම සඳහා සහ ඔවුන්ට තම ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ඇති අයිතිය තහවුරු කර දෙනු ලබන ස්වයං-නිර්ණය අයිතිවාසිකම සිහිපත් කරමින් ද,

මානව හිමිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් දෙකෙහි ම අන්තර්ගත අදාළ විධිවිධානවලට යටත්ව, ජාතීන් හට තම ස්වාභාවික ධනය හා සම්පත් සම්බන්ධයෙන් සමස්ත සහ පරිපූර්ණ ස්වාධිපත්‍යයක් භුක්ති විඳීමට ඇති අයිතිය සිහිපත් කරමින් ද,

ජනවර්ගය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතවාද , ජාතික හෝ සමාජයීය ප්‍රභවය, දේපළ, උපත හෝ වෙනත් යම් තත්වයක් පිළිබඳ කවර හෝ වෙනස්කමකින් තොරව සියලු දෙනාම සඳහා වන මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස කෙරෙහි විශ්වීය ගරුත්වය වර්ධනය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යටතේ රාජ්‍යයන් සතු වන්නා වූ වගකීම පිළිබඳ ව සවිඥානක වෙමින් ද,

යටත්විජිතකරණය, නව-යටත්විජිතකරණය, වර්ණභේදවාදය, සෑම ආකාරයකම වර්ගවාදය හා වර්ගවාදී අසමාන සැලකීම්, විදේශ ආධිපත්‍යය හා අත්පත් කර ගැනීම්, ජාතික පරමාධිපත්‍යයට, ජාතික සමගියට හා භෞමික අඛණ්ඩතාවයට එරෙහි ආක්‍රමණ හා තර්ජන සහ යුධමය තර්ජන

යනාදිය හේතු කොට ගෙන ඇති වන තත්වයන් මගින් බලපෑමට ලක් වූ ජාතීන්ගේ හා පුද්ගලයන්ගේ මානව හිමිකම්වල දරුණු හා බරපතළ උල්ලංඝනය කිරීම් තුරන් කිරීම හරහා මනුෂ්‍ය වර්ගයාගේ සුවිසල් කොටසක සංවර්ධනය කෙරෙහි හිතකර වාතාවරණයක් නිර්මාණය කිරීමට දායක වනු ඇති බැව් සැලකිල්ලට ගනිමින් ද,

වෙනත් කරුණු අතර, සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් අහිමි කිරීම තුළ සංවර්ධනයට මෙන්ම මනුෂ්‍ය වර්ගයාගේ සහ ජාතීන්ගේ පරිපූර්ණත්ව යහසාධනය සාක්ෂාත් කර ගැනීමට එරෙහි බරපතළ බාධාවන් පැවතීම පිළිබඳව සැලකිල්ල යොමු කරමින් ද, මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස අභින්න වන බව සහ අන්‍යොන්‍ය වශයෙන් පරායත්ත වන බව සහ සංවර්ධනය ළගා කර ගැනීමට නම් සිවිල්, දේශපාලන, ආර්ථික, සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීම කෙරෙහි සමාන අවධානය සහ කඩිනම් සැලකිල්ල යොමු කළ යුතු වන බව සලකමින් ද, හුදෙක් ඇතැම් මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, ඒවාට ගරු කිරීම හා ඒවා භුක්ති විඳීම සහතික කළ පමණින් අනෙකුත් මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස අහිමි කිරීම සාධාරණීකරණය කළ නොහැකි බව සැලකිල්ලට ගනිමින් ද,

සංවර්ධනය සඳහා ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම පිණිස අන්තර්ජාතික සාමය සහ ආරක්ෂාව පැවතීම අත්‍යවශ්‍ය අංගයන් වන බව සැලකිල්ලට ගනිමින් ද,

අවිහරණය සහ සංවර්ධනය අතර සමීප සම්බන්ධතාවක් පවතින බවත්, අවිහරණ ක්ෂේත්‍රයේ සිදු වන ප්‍රගතිය මගින් සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලකිය යුතු ලෙස ප්‍රවර්ධනය කෙරෙනු ඇති බවත්, අවිහරණ ක්‍රමෝපායයන් ඔස්සේ මුදා හරිනු ලබන සම්පත් සියලු ජාතීන්ගේ, විශේෂයෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවගේ, ආර්ථික සහ සමාජයීය සංවර්ධනය සහ සුභසිද්ධිය වෙනුවෙන් කැප කරනු ලැබිය යුතු බවත් නැවත තහවුරු කරමින් ද,

සංවර්ධන ක්‍රියාවලියේ කේන්ද්‍රීය සාධකය මනුෂ්‍යයා වන බව හා එබැවින් මනුෂ්‍යයා සංවර්ධන ප්‍රතිපත්ති තුළ සංවර්ධනයේ ප්‍රධාන සහභාගීවන්නා සහ ප්‍රතිලාභියා බවට පත් කරනු ලැබිය යුතු බව හඳුනා ගනිමින් ද,

ජාතීන්ගේ සහ පුද්ගලයන්ගේ සංවර්ධනයට හිතකර වන වාතාවරණයක් නිර්මාණය කිරීම ඒ ඒ රාජ්‍යවල මූලික වගකීම වන බව හඳුනාගනිමින් ද,

මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ආරක්ෂා කිරීම සඳහා අන්තර්ජාතික මට්ටමින් ගනු ලබන ප්‍රයත්නයන්, නව අන්තර්ජාතික ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා වන ප්‍රයත්නයන් සමග සමගාමී විය යුතු බවට සවිඥානක වෙමින් ද,

සංවර්ධනය සඳහා ඇති අයිතිය අත්හළ නො හැකි මානව හිමිකමක් වන බව හා සංවර්ධනය සඳහා සමාන අවස්ථා පැවතීම, ජාතීන්ගේ සහ ජාතීන් සෑදුමලත් පුද්ගලයන්ගේ පරමාධිකාරී අයිතියක් වන බව තහවුරු කරමින් ද,

සංවර්ධනය සඳහා ඇති අයිතිය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබේ.

**1 වන වගන්තිය**

1. සියලු මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගත හැකි ආර්ථික, සාමාජයීය, සංස්කෘතික සහ දේශපාලන සංවර්ධනය සඳහා සහභාගීවීමට, දායකවීමට සහ එය භුක්ති විඳීමට සියලු මනුෂ්‍යයන් හට හා සියලු ජාතීන්ට හිමිකමක් අත් කර දෙන්නා වූ සංවර්ධනය සඳහා ඇති අයිතිය අත්හළ නොහැකි මානව හිමිකමක් වන්නේ ය. .

2. සංවර්ධනය සඳහා ඇති මානව හිමිකම යන්නෙන් මානව හිමිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් දෙකෙහි ම අදාළ විධිවිධානවලට යටත්ව, ජාතීන් හට සිය ස්වාභාවික ධනය සහ සම්පත්

අරහයා පූර්ණ ස්වාධිපත්‍යය පිළිබඳ අත්හළ නොහැකි අයිතිවාසිකම භුක්ති විඳීම ඇතුළු සියලු ජාතීන්ට ස්වයං-නිර්ණය අයිතිවාසිකම පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීම ද අදහස් වන්නේ ය.

**2 වන වගන්තිය**

1. මනුෂ්‍යයා සංවර්ධනයේ කේන්ද්‍රීය සාධකය වන අතර, ඔහු සංවර්ධනය සඳහා ඇති අයිතියේ ක්‍රියාකාරී සහභාගීවන්නා සහ ප්‍රතිලාභියා විය යුත්තේ ය.

2. මිනිසාගේ නිදහස් සහ පරිපූර්ණ යහසාධනය සාක්ෂාත් කර ගැනීම තහවුරු කර ගත හැකි එකම මාර්ගය වන, ඔවුන්ගේ මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස සඳහා මෙන්ම ඔවුන්ගෙන් සමාජයට හා ප්‍රජාවට ඉටු විය යුතු යුතුකම් ද කෙරෙහි වන පූර්ණ ගරුත්වය පැවතීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් සෑම මනුෂ්‍යයෙකුට ම සංවර්ධනය සඳහා තනි හා සාමූහික වගකීමක් ඇති අතර ඒ අනුව ඔවුන් විසින් සංවර්ධනය සඳහා යෝග්‍ය දේශපාලන, සාමාජීය සහ ආර්ථික ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු වන්නේ ය.

3. සංවර්ධනය සඳහා සමස්ත ජනතාවගේ සහ සියලු තැනැත්තන්ගේ ක්‍රියාකාරී, නිදහස් හා අර්ථාන්විත සහභාගීත්වය ලබා ගැනීම සහ සංවර්ධනයෙන් උද්ගත වන ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යාම මත පදනම් වූ ද සමස්ත ජනතාවගේ හා සියලු තැනැත්තන්ගේ ශුභසිද්ධිය නිරන්තර වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගත්තා වූ ද උචිත ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේ අයිතියක් සහ යුතුකමක් රාජ්‍යයන් සතුව ඇත්තේ ය.

**3 වන වගන්තිය**

1. සංවර්ධනය සඳහා ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා හිතකර වන ජාතික සහ අන්තර්ජාතික තත්වයන් නිර්මාණය කිරිමේ මූලික වගකීම රාජ්‍යයන් සතු වන්නේ ය.

2. සංවර්ධනය සඳහා ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම පිණිස එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූල ව රාජ්‍යයන් අතර මිත්‍රශීලී සම්බන්ධතා සහ සහයෝගීතාවය සම්බන්ධයෙන් වන අන්තර්ජාතික නීති මූලධර්මවලට පූර්ණ ගරුත්වය දැක්වීම අවශ්‍ය වන්නේ ය.

3. සංවර්ධනය ළගා කර ගැනීම තහවුරු කිරීමේ දී සහ සංවර්ධනයට එරෙහිව ඇති බාධා තුරන් කිරීමේ දී එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ යුතුකමක් රාජ්‍යයන් සතු වන්නේ ය. සියලු රාජ්‍යයන් අතර ස්වාධිපත්‍යමය සමානත්වය, අන්‍යෝන්‍ය පරායත්තතාව, අන්‍යෝන්‍ය ශුභසිද්ධිය සහ සහයෝගීතාවය මත පදනම් වූ නව අන්තර්ජාතික ආර්ථික ක්‍රමයක් ප්‍රවර්ධනය කෙරෙන පරිද්දෙන් මෙන්ම මානව හිමිකම් ආරක්ෂා කිරීම හා සාක්ෂාත් කර ගැනීම දිරිගැන්වෙන පරිද්දෙන් රාජ්‍යයන් විසින් තම අයිතිවාසිකම් භුක්ති විඳීමත් හා තම යුතුකම් ඉටු කිරීමත් කළ යුතු වන්නේ ය.

**4 වන වගන්තිය**

1. සංවර්ධනය සඳහා ඇති අයිතිය පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සැලසීමේ අරමුණ පෙරදැරිව අන්තර්ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමට තනි තනිව හා සාමූහිකව පියවර ගැනීමේ යුතුකමක් රාජ්‍යයන් සතු වන්නේ ය.

2. සංවර්ධනය වෙමින් පවතින රටවල වඩාත් කඩිනම් සංවර්ධනයක් ඇති කිරීම සඳහා තිරසාර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන්නේ ය. සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් ගනු ලබන ප්‍රයත්නයන්වලට ඌනපූරකයක් ලෙස, එම රටවල පරිපූර්ණ සංවර්ධනය දිරි ගැන්වීම සඳහා එම රටවලට යෝග්‍ය ක්‍රමෝපායන් සහ පහසුකම් සැපයීම පිණිස අන්තර්ජාතික මට්ටමේ ඵලදායී සහයෝගීතාවයක් තිබීම අවශ්‍ය වන්නේ ය.

**5 වන වගන්තිය**

වර්ණභේදවාදය, සෑම ආකාරයකම වර්ගවාදය හා වර්ගවාදී අසමාන සැලකීම්, යටත්විජිතකරණය, විදේශ ආධිපත්‍යය සහ අත්පත් කරගැනීම්, ජාතික පරමාධිපත්‍යයට, ජාතික සමගියට සහ භෞමික අඛණ්ඩතාවයට එරෙහි ආක්‍රමණකාරී ක්‍රියා, විදේශ මැදිහත්වීම් හා තර්ජන, යුධමය තර්ජන, ස්වයං නිර්ණය සඳහා ජාතීන් සතු මූලික අයිතිවාසිකම් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම වැනි තත්ත්වයන් මඟින් බලපෑමට ලක් වූ ජාතීන් සහ මනුෂ්‍යයන් හා සම්බන්ධ දරුණු සහ බරපතල මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් තුරන් කිරීම සඳහා වූ ස්ථිරසාර පියවර රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුත්තේ ය.

**6 වන වගන්තිය**

1. ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව හෝ ආගම පිළිබඳව කවර හෝ වෙනස්කමකින් තොරව සියලු දෙනාම සඳහා වන මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස කෙරෙහි වන විශ්වීය ගරුත්වය ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම, ශක්තිමත් කිරීම සහ ඒවා සුරක්ෂිත කිරීම අරමුණු කර ගෙන සියලුම රාජ්‍යයන් සහයෝගයෙන් කටයුතු කළ යුත්තේ ය.

2. සියලු මානව හිමිකම් සහ නන්වැදෑරුම් මූලික නිදහස අභින්න සහ අන්‍යෝන්‍යව පරායත්ත වන අතර සිවිල්, දේශපාලන, ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහා සමාන අවධානය සහ කඩිනම් සැලකිල්ල යොමු කළ යුත්තේ ය.

3. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මෙන්ම ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන සංවර්ධනයට එරෙහි බාධා තුරන් කිරීමට රාජ්‍යයන් විසින් පියවර ගනු ලැබිය යුත්තේ ය.

**7 වන වගන්තිය**

සියලුම රාජ්‍යයන් විසින් අන්තර්ජාතික සාමය සහ ආරක්ෂාව ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම සහ ශක්තිමත් කිරීම ප්‍රවර්ධනය කළ යුතු වන අතර, ඒ වෙනුවෙන් ඵලදායී අන්තර්ජාතික පාලනයන් යටතේ පොදු හා පරිපූර්ණ අවිහරණය ලඟා කර ගැනීම සඳහා මෙන්ම ඵලදායී අවිහරණ ක්‍රමෝපායක් ඔස්සේ මුදා හරිනු ලබන සම්පත් විශේෂයෙන් ම, සංවර්ධනය වෙමින් පවතින රටවල අංගසම්පූර්ණ සංවර්ධනය වෙනුවෙන් යොදා ගනු ලබන බවට වග බලා ගැනීම සඳහා තමනට කළ හැකි උපරිමය සියලු රාජ්‍යයන් විසින් කළ යුතු වන්නේ ය.

**8 වන වගන්තිය**

1. රාජ්‍යයන් විසින් සංවර්ධනය සඳහා ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ජාතික මට්ටමේ දී ගනු ලැබිය යුතු වන අතර, වෙනත් කරුණු අතර, මූලික සම්පත්, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ආහාර, නිවාස සහ සේවානියුක්තිය වෙත ප්‍රවේශ වීම සඳහා සියලු දෙනාටම සමාන අවස්ථා සලසා දීමටත්, සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීමටත් වගබලා ගත යුත්තේ ය. සංවර්ධන ක්‍රියාවලිය තුළ කාන්තාවන්ට ක්‍රියාකාරී භූමිකාවක් සඳහා ඉඩ ප්‍රස්ථා තහවුරු කරදීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගනු ලැබිය යුත්තේ ය. සියලු සාමාජ අසාධාරණකම් මුලිනුපුටා දැමීම අරමුණු කර ගත් යෝග්‍ය ආර්ථික සහ සාමාජීය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුත්තේ ය.

2. සංවර්ධන ක්‍රියාවලියේ වැදගත් සාධකයක් ලෙස, සියලු මානව හිමිකම් පූර්ණ වශයෙන් භුක්ති විඳීම සාක්ෂාත් කර ගැනීම සඳහා සියලු ක්ෂේත්‍රවල මහජන සහභාගීත්වය රාජ්‍යයන් විසින් දිරිමත් කළ යුතු වන්නේ ය.

**9 වන වගන්තිය**

1. මෙම ප්‍රකාශනයේ දක්වා ඇති සංවර්ධනය සඳහා ඇති අයිතියේ සියලු පැතිකඩ අභින්න සහ අන්‍යෝන්‍ය වශයෙන් පරායත්ත වන අතර ඒ එක් එක් අයිතිවාසිකම සමස්ත සංදර්භය අනුසාරයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුත්තේ ය.

2. මෙම ප්‍රකාශනයේ සඳහන් කිසිවක්, එක්සත් ජාතීන්ගේ අරමුණුවලට සහ මූලධර්මවලට පටහැනි වන බවට හෝ, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ මානව හිමිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිවල දක්වා ඇති අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙන යම් ක්‍රියාකාරකමක නිරතවීමට හෝ යම් ක්‍රියාවක් කිරීමට යම් රාජ්‍යයකට, කණ්ඩායමකට හෝ තැනැත්තකුට අයිතියක් ඇති බවට අදහස් වන ලෙස අර්ථ නිරූපණය නො කළ යුත්තේ ය.

**10 වන වගන්තිය**

ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් ප්‍රතිපත්තිමය, ව්‍යවස්ථාමය සහ වෙනත් යම් ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම, සම්මත කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළු ව සංවර්ධනය සඳහා ඇති අයිතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ ඒ අයිතිය ක්‍රමානුකූලව ශක්තිමත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුත්තේ ය.